සැ. යු.- 2014.03.14 දින පළ වූ අංක 1,854 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,855 - 2014 මාර්තු මස 21 වැනි සිකුරාදා - 2014.03.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 386 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 393 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි* දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්,* 2014 අප්‍රේල් මස 11 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2014 මාර්තු මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

383- B 80822—2,875 (2014/03)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 අප්‍රේල් මස 21 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 පෙබරවාරි මස 28 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කෑගල්ල | කෑගල්ල | මාවතපත්තුව දකුණ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ පරණකුරු කෝරළය විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල |

03-400

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි ප්‍රකාශන බෙදාහැරීමේ සහායක තනතුරු සඳහා වන විවෘත බඳවා ගැනීම

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි ප්‍රකාශන බෙදාහැරීමේ සහායක තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ 'අධ්‍යක්ෂ ජනරාල්' යන පදයෙන් අදහස් කෙරෙන්නේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වේ.

2. *ව්‍යුහගත පරීක්ෂණය.*—ව්‍යුහගත පරීක්ෂණය පැවැත්වෙන දිනය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අය කුසලතා පදනම මත තනතුරට බඳවා ගනු ලැබේ.

| *පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| අතිරේක පළපුරුද්ද | 40 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 35 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 05 |
| එකතුව | 100 |

3. *පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව :*
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි ප්‍රකාශන බෙදාහැරීමේ තනතුරු සඳහා වන විවෘත බඳවා ගැනීම මගින් තනතුරු පුරප්පාඩු 05ක් කොන්ත්‍රාත් පදනම මත සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත.

4. *පත්වීම ක්‍රියාත්මක වන දිනය :*

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

5. *සේවා කොන්දේසි.*—රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ඒ සඳහා කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද යටත් ව තෝරාගනු ලබන අයෙකු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන බෙදා හැරීමේ සහායක තනතුරට කොන්ත්‍රාත් පදනම මත පත් කරනු ලැබේ.

6. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බලය ඇත.

7. *වැටුප්/දීමනා :*
PL 01-2006 (A) වැටුප් කාණ්ඩයේ මූලික වැටුප් පියවරට සමාන දීමනාවක් සහ අනුමත ජීවන වියදම් දීමනාව.

8. *සුදුසුකම්.*—ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට,
(i) *අධ්‍යාපන සුදුසුකම්.*—අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම;

(ii) වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ
(iii) පළපුරුද්ද : අදාළ නොවේ
(iv) කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(v) වෙනත් : (i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් වන සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

9. වයස : අවම සීමාව : අවුරුදු 18
උපරිම සීමාව : අවුරුදු 45

10. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(a) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත් නිවේදනයේ දැක්වෙන ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(b) සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05, යන ලිපිනය වෙත 2014.04.15 වැනි දිනට පෙර ලැබෙන පරිදි එවිය යුතුය. ඉල්ලුම්පත් බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන බෙදාහැරීමේ සහායක තනතුර සඳහා වන විවෘත බඳවා ගැනීම යන වචන සටහන් වී තිබිය යුතුය. එදිනට පසු ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

(c) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

12. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්තම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

2014 පෙබරවාරි මස 24 වැනි දින,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.
අංක 163, කිරුළපන මාවත, කොළඹ 05

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහායි.)

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි ප්‍රකාශන බෙදා හැරීම සඳහා වන විවෘත බඳවා ගැනීම

1.0 මාධ්‍යය :
සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 මුල'කුරු අගට යොදා මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදාහරණ : SILVA, A. B. :————.
2.2 සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.
2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.5 ස්ත්‍රී/පුරුෂභාවය :
පුරුෂ - 0 අදාළ අංකය කොටුව තුළ ලියන්න.
ස්ත්‍රී - 1

2.6 විවාහක/අවිවාහක බව :
අවිවාහක - 1 අදාළ අංකය කොටුව තුළ ලියන්න
විවාහක - 2

2.7 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ -2, ඉ. දෙමළ - 3, මුස්ලිම් -4, වෙනත් -5)
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

2.8 ජාතික හැඳුනුම්පත් අංකය :

2.9 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

2.10 දුරකථන අංකය (තිබේ නම්) :

3.0 අධ්‍යාපන සුදුසුකම් :

පළමුවර : වර්ෂය : විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

දෙවනවර : වර්ෂය : විභාග අංකය :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

4.0 වෘත්තීය සුදුසුකම් :————.

5.0 පළපුරුද්ද :————.

6.0 අයදුම්කරුගේ සහතිකය :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

03-437

---

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන විවෘත බඳවා ගැනීම (සම්පාදක කාර්ය සහායක (නඩත්තු)

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ 'අධ්‍යක්ෂ ජනරාල්' යන පදයෙන් අදහස් කෙරෙන්නේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වේ.

2. *ව්‍යුහගත පරීක්ෂණය.*—ව්‍යුහගත පරීක්ෂණය පැවැත්වෙන දිනය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අය කුසලතා පදනම මත තනතුරේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| අතිරේක පළපුරුද්ද | 40 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 35 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | 05 |
| *එකතුව* | 100 |

3. *පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව :*
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන විවෘත බඳවා ගැනීම (සම්පාදක කාර්ය සහායක (නඩත්තු), තනතුරු පුරප්පාඩු 01ක් පිරවීමට කටයුතු කරනු ඇත.

4. *පත්වීම ක්‍රියාත්මක වන දිනය :*

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

5. *සේවා කොන්දේසි.*—රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලටද, 2013.04.23 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලටද, එම බඳවා ගැනීමේ පටිපාටියට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සම්පාදක කාර්යසහායක තනතුරට පත් කරනු ලැබේ.

6. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බලය ඇත.

7. *වැටුප් :*
වැටුප් කේත අංකය : PL 02 - 2006 (A)
වැටුප් පරිමාණය : රු. 12,210-10x130-10x145-10x160-12x170-
රු. 18,600/-

ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය (රු.)* |
|---|---|---|
| III | පියවර 01 | 12,210.00 |
| II | පියවර 12 | 13,655.00 |
| I | පියවර 22 | 15,120.00 |
| විශේෂ | පියවර 32 | 16,730.00 |

(පත්වීමේ දින සිට වසර 03ක් ඇතුළත I වැනි කාර්යක්ෂමතා කඩඉම සහ II ශ්‍රේණියට උසස් වී වසර 03ක් ඇතුළත II වැනි කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු අතර, I ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගතවීමට පෙර III වන කාර්යක්ෂමතා කඩඉම ද සමත්විය යුතු අතර, 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.)

8. *සුදුසුකම්.*—ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට,
   (i) *අධ්‍යාපන සුදුසුකම් :* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.
   (ii) *වෘත්තීය සුදුසුකම්.*—අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි ( N. V. Q.) අවම මට්ටමින් දෙවන මට්ටමේ නිපුනතාවක් ලබාගෙන තිබීම.
   (iii) *පළපුරුද්ද.*—එක් එක් තනතුරට අදාළව පිළිගත් ආයතනයක වසර 2ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(iv) *කායික සුදුසුකම්.*—සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(v) වෙනත් : (i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් වන සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

09. වයස : අවම සීමාව : අවුරුදු 18
උපරිම සීමාව : අවුරුදු 45

10. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(a) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත් නිවේදනයේ දැක්වෙන ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(b) සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05. යන ලිපිනය වෙත 2014.04.15 වැනි දිනට පෙර ලැබෙන පරිදි එවිය යුතුය. ඉල්ලුම්පත් බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සම්පාදක කාර්ය සහායක (නඩත්තු) තනතුර සඳහා වන විවෘත බඳවා ගැනීම යන වචන සටහන් වී තිබිය යුතුය. එදිනට පසු ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

(c) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

12. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්තම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද,

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

2014 පෙබරවාරි මස 24 වැනි දින,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.
අංක 163, කිරුළපන මාවත, කොළඹ 05

ආදර්ශ අයදුම් පත්‍රය

☐
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහායි.)

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන විවෘත බඳවා ගැනීම සම්පාදක කාර්ය සහායක (නඩත්තු)**

1.0 මාධ්‍යය :
සිංහල - 1
දෙමළ - 2 ☐
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————. උදාහරණ : SILVA, A. B.
2.2 සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.
2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.5 ස්ත්‍රී/පුරුෂභාවය :
පුරුෂ - 0 ☐ අදාළ අංකය කොටුව තුළ ලියන්න.
ස්ත්‍රී - 1

2.6 විවාහක/අවිවාහක බව :
අවිවාහක - 1 ☐ අදාළ අංකය කොටුව තුළ ලියන්න.
විවාහක - 2

2.7 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ -2, ඉ. දෙමළ - 3, මුස්ලිම් -4, වෙනත් -5)
අදාළ අංකය කොටුව තුළ ලියන්න. ☐

2.8 ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

2.9 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

2.10 දුරකථන අංකය (තිබේ නම්) : ☐☐☐☐☐☐☐☐☐☐

3.0 අධ්‍යාපන සුදුසුකම් :

පළමුවර : වර්ෂය : විභාග අංකය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

දෙවනවර : වර්ෂය : විභාග අංකය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

4.0 වෘත්තීය සුදුසුකම් :————.

5.0 පළපුරුද්ද :————.

6.0 අයදුම්කරුගේ සහතිකය :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

03-438

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

## කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා බඳවා ගැනීම

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය.*—නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. අවශ්‍ය සුදුසුකම් :-

(i) *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්*
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබාතිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) *පළපුරුද්ද :*
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් තිබීම.

(iii) *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) *වෙනත්*

* දෙමළ භාෂා හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය අමතර සුදුසුකමක් වේ.
* ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
* අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
* අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :-

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු හා විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. නීති නිලධාරි III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 ට අනුව හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව :-*
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩුවිය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

05. *වැටුප් පරිමාණය :-*
මෙම තනතුරට රු. 22,935- 10 x 645 - 8 x 790 - 17 x 1,050 -රු. 53,555 ක මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 හි අංක SL 1-2006 වැටුප් ඛණ්ඩය)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 1. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | 20 |
| | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලද නීතිය පිළිබඳව උපාධිය, | 20 | |

| *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|
| පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා හෝ නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |

සටහන : ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය 1997 වසරට ප්‍රථම සමත් වුවහොත් ලකුණු 10 ක් පමණක් ලබාදිය යුතුයි.
(උපරිම සුදුසකම සඳහා පමණක් ලකුණු ලබාදේ. උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක් ලකුණු ලබාදිය යුතුය.)

2. *අතිරේක වෘත්තීය සුදුසුකම්* 15

පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන ලද අදාල ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්)
පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාල ක්ෂේත්‍රය පිළිබඳ මාස 06 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්)
පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාල ක්ෂේත්‍රය පිළිබඳ මාස 03 කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්),

3. *අතිරේක පළපුරුද්ද*

නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද - මාස 06 කට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02 30

එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 30 ක් (මූලික සුදුසුකම ලබාගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03 ක සේවා කාලය හැර)

(අවුරුදු 20 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය).

4. *පරිඝණක සාක්ෂරතාව* 15

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම සඳහා 15

රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 ක් සඳහා 10
රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා
මාස 06/පැය 720 07
මාස 03/පැය 360 05

5. *ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය* 15

ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/ උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/ නීතිවේදී උපාධිය 15
(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය)

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01 ක් හෝ පැය 1500) 10
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා,
මාස 06/පැය 720 7
මාස 03/පැය 360 5

6. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය 05

මුළු එකතුව 100

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :-*

(i) අයදුම්පත් 2014.04.21 දිනට හෝ එදිනට ප්‍රථම "අධ්‍යක්ෂ, ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ. පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ 10" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 07 දක්වාත්, දෙවන පිටුව අංක 08 සිට 11 දක්වාත්, අනිකුත් කරුණු ඊළඟ පිටුවලටද වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නීති නිලධාරි තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/

දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 22,935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :-

(i) ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය.

නිපුණතා පියස, අංක 354/2,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත්‍රය**

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජන සඳහා

***කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා අයදුම්පත***

1. අයදුම්කරුගේ නම :
   (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
   (ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
   (iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ලිපිනය හා දුරකථන අංකය :
   (i) කාර්යාලයීය ලිපිනය :————.
   දුරකථන අංකය :————.
   (ii) පෞද්ගලික ලිපිනය :————.
   දුරකථන අංකය :————.
   ජංගම දුරකථන අංකය :————.

   (ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක් වුවහොත්, වහාම දැන්විය යුතු ය.)

3. උපන් දිනය :
   අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

   අවුරුදු :————. මාසය :————. දින :————.

5. ජාතික හැඳුනුම්පත් අංකය :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

7. විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

8. අධ්‍යාපන සුදුසුකම් :

   (i) නීතිය පිළිබඳ උපාධිය ලබාගත් විශ්වවිද්‍යාලය, දිනය හා භාෂා මාධ්‍ය :————.

   (ii) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු ලෙස දිවුරුම් දුන් දිනය :————.

9. නීතිඥයකු ලෙස වෘත්තීය පළපුරුද්ද : අවුරුදු :————.

10. වෘත්තීය සුදුසුකම් :-

| *විභාගය/ ඩිප්ලෝමාව* | *වර්ෂය* | *පෙනී සිටි විෂයයන්* | *සාමාර්ථය* | *ආයතනයේ/ විශ්වවිද්‍යාලයේ නම* |
|---|---|---|---|---|
| | | | | |

11. පළපුරුද්ද පිළිබඳ විස්තර :

| *සේවය කළ ආයතන* | *තනතුර* | *සේවය කළ කාලය* | *රාජ්‍ය අංශය/ අර්ධ රාජ්‍ය අංශය /පෞද්ගලික අංශය යන වග* |
|---|---|---|---|
| | | | |

12. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ ලබා ඇති ප්‍රවීණතාවයන් :
   උපාධිය :————.
   ඩිප්ලෝමාව :————.
   සහතික පත්‍ර පාඨමාලාව :————.

13. ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ඇති ප්‍රවීණතාවය :

   ඉංග්‍රීසි මාධ්‍ය උපාධිය :————.

ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව :————.
ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව :————.

14. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම් පෙළපතින් ද/ලියාපදිංචි කිරීමෙන් ද යන්න සඳහන් කරන්න. (ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න.) :————.

15. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කර තිබේ ද? :————.

16. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම් ඔබට විරුද්ධව දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේ ද? :————.

17. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් නුසුදුස්සෙක් වීමට යටත් වන බවත් පත් කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

18. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................... මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු/ඇය ........... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන.

දිනය :————.

(මෙම කොටස අදාළ වනුයේ රජයේ රැකියාවක නියුක්ත වූවන්ට පමණි)

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන ...................... මයා/මිය/මෙනවිය දැනට ........... තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වන බවත් විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ
බලය පැවරුණු නිලධාරියාගේ අත්සන.

දිනය :————.
(නිල මුද්‍රාව)

03-436

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2014

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීමට අංක 1837/8 හා 2013.11.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාවේ සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (පිරිමි අයදුම්කරුවන් බඳවා ගැනීම හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අවශ්‍යතා පදනම් කර ගනිමින් සිදු කරනු ලැබේ.)

01. මෙහි දී බඳවා ගන්නා සංඛ්‍යාව එක් එක් වර්ෂයෙන් අයදුම් කරන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදනු ලැබේ. අනතුරුව එම එක් එක් වර්ෂය සඳහා බඳවා ගැනීමට නියමිත ප්‍රමාණය එම වර්ෂයේ අදාළ ජීව විද්‍යා, ගණිතය හා කෘෂි විද්‍යා විෂයය ධාරාවන්ගෙන් අයදුම් කරන සිසුන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා ඉන් අනතුරුව ඉහලම Z අගය ලබා ඇති අයදුම්කරුවන් අතුරින් දිස්ත්‍රික් පදනම මත සුදුස්සන් තෝරා ගනු ලැබේ.

02. මෙම පාඨමාලාවන් පූර්ණකාලීන පාඨමාලාවන් වේ. එබැවින් සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන ආයතනයක හෝ පූර්ණකාලීන පාඨමාලාවන් හදාරන සිසුන් මේ සඳහා අයදුම් නොකළ යුතු ය. යමෙකු එසේ අයදුම්කර පසු අවස්ථාවක දී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන්/ තනතුරෙන් ඉවත්කර ඒ වන තෙක් රජය විසින් ඔහු/ඇය වෙනුවෙන් දරන ලද සියලුම වියදම් අය කර ගනු ලැබේ. විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක හෝ පූර්ණකාලීන පාඨමාලාවක් හදාරන අයකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම් ඔවුන් පහත දැක්වෙන ආකාරයට ක්‍රියාකළ යුතු ය.

2.1 2014.04.10 දින වන විට ඔබ කුමන හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක හෝ පූර්ණ කාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි ව සිටියේ නම් හෝ සිටින්නේ නම් සිසු හෙද පුහුණුව සඳහා තේරී පත් වුවහොත් හෙද පුහුණුව සඳහා හෙද විදුහලේ ලියාපදිංචි කරන දිනට පෙර අදාළ පුහුණුවෙහි හෝ පාඨමාලාවෙහි ලියාපදිංචිය අවලංගු කර ගත යුතු ය.

2.2 2014.04.10 දින වන විට ඔබ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන පාඨමාලාවක හෝ ලියාපදිංචි වී නොසිටි අයෙක් වුව ද යම් හෙයකින් සිසුහෙද පුහුණුවට අභ්‍යාසලාභීන් ලියාපදිංචි කරන දින වන විට ලියාපදිංචිව සිටියේ නම් ඔහු ද සිසු හෙද පුහුණුවේ ලියාපදිංචිය ලබා ගැනීමට පෙර එම පාඨමාලාවේ ලියාපදිංචිය අවලංගු කරගත යුතු ය.

2.3 සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලා වල ලියාපදිංචි වී සිටින අයදුම්කරුවන් වේ නම් ඔවුන් සිසු හෙද පුහුණුවට තේරී පත්වුවහොත් ඒ වනවිට ලබමින් සිටි පුහුණුවට අදාළව අත්සන් කර තිබෙන ගිවිසුම් වලට අනුව ගිවිසුම් ගත මුදල හා ඒ වන විට ලබා ඇති සියලු දීමනාවන් ගෙවා අදාළ පුහුණුවෙන් ඉවත් වුවහොත් පමණක් සිසු හෙද පුහුණුව සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

සැලකිය යුතුය :

1 ඉහත 2.1 සිට 2.3 දක්වා සඳහන් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පුහුණුව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතු ය.

2. එමෙන්ම ඔබ ප්‍රමාණවත් Zඅගයක් ලබා මෙහි සඳහන් අනෙකුත් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද 2.1 සිට 2.3 දක්වා සඳහන් කොන්දේසි සපුරා නොමැති නම් කිසිදු අයුරකින් මෙම පුහුණුව සඳහා ලියාපදිංචි කරනු නොලැබේ.

03. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අ. පො. ස. (උ. පෙළ) විභාගයක දී විද්‍යා විෂයය ධාරාවට අයත්, ජීව විද්‍යා/ගණිතය/කෘෂි විද්‍යා යන විෂයය ධාරාවන් ගෙන් එක් විෂය ධාරාවකින් සියලුම විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම;

සහ

(ආ) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් 04ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

04. *අනෙකුත් සුදුසුකම් :*

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

(ආ) 2014.04.10 වැනි දිනට වයස අවුරුදු 18 නොඅඩු හා වයස අවුරුදු 28ට නොවැඩි විය යුතු ය.

(ඇ) උස අඩි 04 අඟල් 10 (147.3cm) ට නොඅඩු විය යුතු ය.

(ඈ) අවිවාහක විය යුතු ය.

(ඉ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍යය විය යුතු ය.

(ඊ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2014.04.10 දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතු ය. පදිංචිය සනාථ කිරීමට පහත කරුණු වලින් එකක් සපුරා තිබිය යුතු අතර අදාළ ලිපි ලේඛන සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ ඉදිරිපත් කළ යුතු ය.

(i) 2014. 04.10 වැනි දිනට පූර්වාසන්න වසර 05ක් තුළ ඔහු එම දිස්ත්‍රික්කය තුළ අවුරුදු 03ක් වත් අඛණ්ඩව පදිංචි වී සිටිය යුතු ය. (මෙහිදී ප්‍රාදේශීය ලේකම් අනුඅත්සන් කළ ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කළ යුතු ය)

(ii) නොකඩවා අවුරුදු 05ක් එම අදාළ දිස්ත්‍රික්කයේ ද්විතීක පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතු ය. (ඒ සඳහා පාසල් හැරයාමේ සහතිකය ඉදිරිපත් කළ යුතු ය.)

(iii) අපේක්ෂකයා අදාළ දිස්ත්‍රික්කය තුළ උපන් අයෙකු වීම. (උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතු ය.)

(iv) දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ලබාගත් පූර්වාසන්න වසර 03ක ඡන්ද හිමි නාමලේඛනවල උපුටන ඉදිරිපත් කළ යුතු ය.

*සටහන.*-යම් අපේක්ෂකයෙකුගේ පියා හෝ මව හෝ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටියේ නම් එම අපේක්ෂකයාට තම මවගේ හෝ පියාගේ හෝ උපන් දිස්ත්‍රික්කය තමා අයත් දිස්ත්‍රික්කය ලෙස තෝරා ගත හැක. (මවගේ හෝ පියාගේ උප්පැන්න සහතිකය හා ඔවුන්ගේ සේවය තහවුරු කරන ලේඛන ඉදිරිපත් කළ යුතු ය).

05. *අයදුම් කළ යුතු ක්‍රමය :*

(අ) මෙම නිවේදනය අග දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත් සකස් කළ යුතු වේ;

ආදර්ශ අයදුම්පතේ දක්වා ඇති අංක 01 සිට අංක 09 දක්වා වගන්ති 01 පිටුවේ ද අංක 10 වගන්තිය 02 වැනි පිටුවේ ද අංක 11 සිට අංක 13 දක්වා වගන්ති 03 වැනි පිටුවේ ද වන පරිදි අයදුම්පත් සකස් කළ යුතු වේ. තවද අයදුම්පතේ ඉහළ දකුණු කෙළවරේ කොටුවේ අදාළ තොරතුරු අනිවාර්යෙන්ම ඇතුළත් කළ යුතු ය.

(ආ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් කවරයකට බහා එම කවරයේ ඉහත වම් කෙළවරේ අනිවාර්යයෙන්ම "සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2014" හා පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කොට 2014.04.10 වැනි දිනට පෙර "අධ්‍යක්‍ෂ (පාලන) 01, සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ;

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ/ රජයේ ගණකාධිකාරී සේවයේ/රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වාර්ෂිකව රු. 2,40,360 ට නොඅඩු ආරම්භක වැටුපක් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතු වේ.

(ඈ) අයදුම්පතේ අයදුම්කරුගේ අත්සනට ඉහලින් රු. 300ක වලංගු මුද්දර අලවා තම අත්සන යොදා එම මුද්දර අවලංගු කළ යුතු ය.

06. අසම්පූර්ණ, ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල නොවන, මුද්දර අලවා නොමැති හා 2014.04.10 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් ලද බවද දන්වා එවනු නොලැබේ.

07. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම්

කරගෙන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සෞඛ්‍ය ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් හෙද ව්‍යවස්ථාවේ හා මෙම ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

08. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් හා එම ලේඛනවල තමා විසින් සහතික කරන ලද පිටපත් ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු ලේඛනයක් බාරගනු නොලැබේ.

(අ) උප්පැන්න සහතිකය,

(ආ) අ. පො. ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකය,

(ඇ) අ. පො. ස. (සා/පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකය,

(ඈ) ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය,

(ඉ) ඉහත 4 (ඊ) අනුව පදිංචිය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන,

(ඊ) අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවකු ඉදිරියේ අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශයක්.

08. *පුහුණු කිරීමේ පරිපාටිය* :

(අ) තෝරාගත් අයදුම්කරුවන් සිදු හෙද/හෙදියන් වශයෙන් හෙද පුහුණු පාසැල්වලට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් විසින් අවුරුදු 03 ක පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරිය යුතු වේ.

(ආ) පුහුණුව සඳහා ඇතුළත් කරන අවස්ථාවේ අභ්‍යාසලාභීන් වෙත හෙද පුහුණු පාසැල්වල බලපැවැත්වෙන නීතිරීති මාලාවක් සපයනු ලැබේ. මෙම නීතිරීතිවලට හා කලින් කළ පනවනු ලබන වෙනත් නීතිරීතිවලට ද ඔවුන් යටත් වනු ඇත.

(ඇ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන හෝ පුහුණුවට බඳවා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බව හෙළිවුවහොත් හෝ අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය. පුහුණු කාලය තුළදී අභ්‍යාසලාභීන් කිසිම ආකාරයක නිවාඩුවකට හිමිකම් නොලබන අතර පුහුණුව සඳහා නොපැමිණෙන දින වෙනුවෙන් දීමනාවෙන් සමානුපාතික මුදලක් අඩු කරනු ලැබේ. කෙසේ වෙතත් විභාගයට පෙනී සිටීම සඳහා සෑම වර්ෂයකම 80%ක පැමිණීම අනිවාර්ය වේ.

(ඈ) හෙද විද්‍යුහලක පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ අභ්‍යාසලාභීන්ට පහත සඳහන් පරිදි දීමනාවක් ගෙවනු ලැබේ.

1. පළමු අවුරුද්ද - මාසිකව රු. 12,920
2. දෙවන අවුරුද්ද - මාසිකව රු. 13,040
3. තෙවන අවුරුද්ද - මාසිකව රු. 13,160

පුහුණුව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවසාන විභාගයෙන් සමත්වන අභ්‍යාසලාභීන්ට III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුරට අදාළ වැටුප් පරිමාණය මත එම තනතුරේ ඇති වන පුරප්පාඩු අනුව සෞඛ්‍ය ලේකම් විසින් පත්වීම් දෙනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත්වුවහොත් හෝ ඉවත්කළහොත් හෝ පුහුණුව හැර ගියහොත් පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනා හා රජය විසින් පුහුණුව සඳහා දරන ලද වියදම් සඳහා වැය වූ මුදල ඔහු හෝ ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වේ. එසේ නොවුවහොත් එම මුදල අයකර ගැනීමට නිසි පියවර ගනු ඇත.

10. *විවාහ නොවීමේ කොන්දේසි හා ගිවිසුම* :

(අ) සියලුම අයදුම්කරුවන් ඉල්ලුම් පත්‍ර එවන දිනය වන විට අවිවාහකව සිටිය යුතු අතර, පුහුණුව ලබන කාලය තුළ දී ද අවිවාහකව සිටීම අනිවාර්ය වේ. අවිවාහක බව සනාථ කිරීම සඳහා සියලුම අයදුම්කරුවන් විසින් සාමදාන විනිශ්චයකාරවරයෙකු ඉදිරියේ දී අත්සන් තබන ලද දිවුරුම් ප්‍රකාශයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු වේ.

(ආ) සිසු හෙද/හෙදියන් හෙද පුහුණු පාසලට ඇතුළත් වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව අවම වශයෙන් අවුරුදු 10ක කාල පරිච්ඡේදයක් සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයක් යටතේ ඇති රෝහලක සේවය කරන බවටත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ඇපකරයකට හා ගිවිසුමකට එළඹිය යුතු ය. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම කාල පරිච්ඡේදය කලින් කලට නිශ්චය කරනු ඇත.

11. *සේවයෙහි නියුක්ත කරවීමේ නියමයන්* :

(අ) පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත් අපේක්ෂක අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවා ගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පවත්නා පුරප්පාඩු මත අදාළ තනතුරේ III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද/හෙදි නිලධාරි තනතුරට පත්කිරීම සඳහා සලකා බලනු ලැබේ.

(ආ) ඉහත පරිදි පුහුණුවෙන් පසුව පැවැත්වෙන අවසන් විභාගයේ ප්‍රතිඵල මත පත් කරනු ලබන III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුර විශ්‍රාම වැටුප් සහිතවන අතර, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(ඇ) III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුරුවලට පත්කරනු ලබන්නේ අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ව ය.

12. *සේවා කොන්දේසි* :

(අ) සියලුම අභ්‍යාසලාභීන් පුහුණුව ආරම්භ කිරීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීම අවශ්‍ය වේ.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006(iv)හි MT7-2006 "A" පරිදි රු. 15,620-4x180-6x240-11x320-20x360-රු. 28,500 වැටුප්

පරිමාණය මත හෙද නිලධාරීන් III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුරුවල පවත්නා පුරප්පාඩු සඳහා පත්කරනු ලැබේ.

(ඈ) හෙද සේවයේ සියලුම නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝගවලට, හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලට, රජයේ මුදල් රෙගුලාසිවලට, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද යටත්වනු ඇත.

(ඈ) අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත් පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යට කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නිත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, ඒ දෙනු ලබන පත්වීම් අවලංගු කර/පුහුණුවෙන්/තනතුරෙන් පහ කරන අතර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුලත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තව ද පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල් වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී.

(ඊ) මෙම පුහුණු කාල සීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදු කළ බව අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු සිදු කරනු ඇත.

(උ) පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය නොවන යම් ගැටළු සහගත කරුණක් උද්ගත වුවහොත්, ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ. මෙම ගැසට් නිවේදනයේ සිංහල/දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2014 පෙබරවාරි මස 28 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

සෞඛ්‍ය අමාත්‍යාංශය

*සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2014*

| | |
|---|---|
| දිස්ත්‍රික්කය | |
| උසස් පෙළ විෂයය ධාරාව | |
| උසස් පෙළ සමත් වූ වර්ෂය | |
| මාධ්‍ය | |

01\. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

02\. තැපැල් ලිපිනය (ඉංග්‍රීසියෙන්) :————.

03\. (i) ස්ථිර ලිපිනය : (සිංහලෙන්)

(ii) දිස්ත්‍රික්කය (ඉංග්‍රීසියෙන්)

(iii) දුරකථන අංකය : ජංගම

ස්ථාවර

04\. උපන් දිනය : වර්ෂය : 19 ————. මාසය :————. දිනය :————.

05\. 2014.04.10 වැනි දිනට වයස :————. අවු. :————. මාස :————. දින :————.

06\. ස්ත්‍රී/පුරුෂ භාවය :

| | |
|---|---|
| පුරුෂ | |
| ස්ත්‍රී | |

අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.

07\. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.

08\. ජාතික හැඳුනුම්පත් අංකය

09\. උස : (a) අඩි :————. අඟල් :————. (b) සෙන්ටිමීටර් :————.

10. (අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

(1) වර්ෂය :————. විභාග අංකය :————.
Z අගය :————. විෂය ධාරාව :————.

| විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|
| 1. | | | 3. | | |
| 2. | | | 4. | | |

(ආ) අ. පො. ස. (සා. පෙළ) විභාගය

පළමු වාරය :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ii) විභාග අංකය :————.

| විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|
| 1. සිංහල | | | 7. | | |
| 2. ඉංග්‍රීසි | | | 8. | | |
| 3. ගණිතය | | | 9. | | |
| 4. විද්‍යාව | | | 10. | | |
| 5. | | | 11. | | |
| 6. | | | 12. | | |

දෙවැනි වාරය :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.

| විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|
| 1. | | | 7. | | |
| 2. | | | 8. | | |
| 3. | | | 9. | | |
| 4. | | | 10. | | |
| 5. | | | 11. | | |
| 6. | | | 12. | | |

11. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වැරදිකරු වී ඇත් ද?

ඔව්

නැත

ඔව් නම් විස්තර සපයන්න. :————.

12. අයදුම්කරුගේ සහතිකය/ප්‍රකාශය :

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව පසුව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

රු. 300 වටිනාකමක් සහිත මුද්දර අලවා අත්සන යොදා අවලංගු කළ යුතු ය.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ………………… මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය 2014 ………… වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ,
සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

03-411

---

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2014 මාර්තු

1991.05.17 වැනි දින හා අංක 662/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද සෞඛ්‍ය සේවාවේ වෛද්‍ය නිලධාරින් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින් ස්ථිර කිරීමට පෙර සමත් විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2014 මැයි මස 25 වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාල සටහන ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. *සුදුසුකම්* :
මෙම විභාගයට අයදුම් කළ හැක්කේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින්ගෙන් මෙතෙක් අදාළ විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරින්ට පමණි.

03. *අයදුම්පත්* :

මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා වෙත 2014 අප්‍රේල් 21 වැනි දින හෝ ඊට ප්‍රථම භාර දිය යුතු ය. සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ බවට ආයතන ප්‍රධානීන් විසින් සහතික කරන ලද අයදුම්පත් කොළඹ 10, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, සෞඛ්‍ය අමාත්‍යාංශයේ, "සුවසිරිපාය" ගොඩනැගිල්ලේ අධ්‍යක්ෂ (විභාග) වෙත 2014 අප්‍රේල් 25 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතු ය. සෑම අයදුම්පත්‍රයක ම දක්වා ඇති තොරතුරු නිවැරදි බව කොට්ඨාස

ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය. තම අයදුම්පත සමග ලිපිනය ලියන ලද රු. 30 ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද එවිය යුතු ය. (මෙහි කැමති පරිදි රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකි ය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැ. යු* : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 වර්ගයේ කඩදාසියක පළමු පිටුවේ අංක 1 සිට 4 (ඈ) දක්වාත්, දෙවන පිටුවේ අංක 4 (ඈ) සිට අංක 8 දක්වාත් සකස් කළ යුතු ය. ඉහත ආකෘතියට අනුකූල නොවන සහ අසම්පූර්ණ සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. *විභාග ගාස්තු* :

(i) විභාගයට පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ.
අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25 බැගින් අවලංගු නොකළ මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන සහ දිනය යොදා ඒවා නිසිලෙස අවලංගු කළ යුතු ය.

(ii) කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. *විභාගයට ඇතුලත් කර ගැනීම* :

(i) පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයින්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.
(ii) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) පුද්ගල හැඳුනුම්පත්‍රය,
(ආ) දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත්‍රය,
(ඇ) රියදුරු බලපත්‍රය,
(ඈ) විදේශ ගමන් බලපත්‍රය.

(iii) කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකි ය. එසේ ඔබේ නමට අදාළ විභාග අංකය හා විභාග මධ්‍යස්ථානය සොයා ගත්තේ නම් ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක්ද සමග වෙබ් අඩවියේ සඳහන් ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරු කර විභාගයට පෙනී සිටිය හැකි ය. ප්‍රවේශ පත්‍ර ලැබුණු අයදුම්කරුවන් අත්සන සහතික කර රැගෙන පැමිණිය යුතු ය. අත්සන සහතික කරන ලද ලිපිය හෝ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්හට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.
(*වෙබ් අඩවිය*-WWW. health. gov.lk)

06. *විභාග පරිපාටිය* :
මෙම විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර තුනකින් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයකින් සමන්විතය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත් වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50 ක් ලබා ගත යුතු ය. එක් වරක දී හෝ කිහිපවරක දී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. නිලධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ දී අදාළ සියළුම විෂයන්ට පෙනී සිටිය යුතු ය.

07. *විභාග විෂය නිර්දේශ මාලාව* :

07:1 ලිඛිත විභාගය :

07:1:1 ආයතන සංග්‍රහය :
කාලය පැය 02 යි, ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතු ය.

විෂය නිර්දේශය :

(i) ආයතන සංග්‍රහය

(අ) I කොටස — II, III, V, VI, VII, VIII, IX, XI, XII, XIII, XV, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXI, XXXII, XXXIII පරිච්ඡේදයන්
(ආ) II කොටස — XLVII සහ XLVIII වැනි පරිච්ඡේදයන්

(ii) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය රෙගුලාසි

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සංයුතිය හා කාර්යභාරය

7:1:2 රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය
කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතු ය.
විෂය නිර්දේශය :
සෞඛ්‍ය සේවා සංග්‍රහය
(i) වැනි කොටස - වෛද්‍ය සේවා
(ii) වැනි කොටස - රසායනාගාර සේවා

07:1:3 ගිණුම් :
කාලය පැය 02 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතු ය.

විෂයය නිර්දේශය
(i) රජයේ මුදල් රෙගුලාසි
පරිච්ඡේද I - සියළුම වගන්ති
පරිච්ඡේද II - සියළුම වගන්ති
පරිච්ඡේද III - සියළුම වගන්ති
පරිච්ඡේද IV - සියළුම වගන්ති
පරිච්ඡේද V - 1, 2, 3, 4 සහ 6 වගන්ති
පරිච්ඡේද VI - සියළුම වගන්ති
පරිච්ඡේද VII - 1, 2, 3, 4 සහ 6 වගන්ති
(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම් තැබීම පිළිබඳ රෙගුලාසි
(iii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සංවිධාන සංග්‍රහයේ මුදල් පිළිබඳ ඡේදයන්
(iv) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකුගේ දෛනික රාජකාරිවලට අදාළ වන මුදල් රෙගුලාසි

07:2 සිංහල/දෙමළ වාචික පරීක්ෂණය :
සිංහල/දෙමළ භාෂා ප්‍රවීනතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් කොළඹ දී පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙනයාමේ දී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහලෙන් හෝ දෙමළෙන් සාකච්ඡා කිරීමට නිලධාරීන්ට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ.

08. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ කොට්ඨාසයේ/ විශේෂිත ව්‍යාපාරයේ/ආයතනයේ සේවයෙහි නියුතු අදාල නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health. gov.lk වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත.

සැ. යු.-විභාග නිවේදනයේ දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තනයන් අතර යම් ව්‍යාකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බල පැවැත්වේ.

එම්. බී. එල්. රහුමාන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)II,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

මගේ අංකය සීඑෆ්/ඊඑක්ස්ඊ/02/2014
2014 මාර්තු මස 07 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

[ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත**

***ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2014 මාර්තු***

01 (අ) (i) අයදුම්කරුගේ නම (සිංහලෙන් හෝ දෙමළෙන් මුලකුරු අගට යොදා ලියන්න) :————.

(ii) අයදුම්කරුගේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින් මුලකුරු අගට යොදා ලියන්න) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.

(iv) මුලකුරු වලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(ආ)(i) නිළ නාමය (අදාළ කොටුව තුළ (✓) ලකුණ යොදන්න.
වෛද්‍ය නිලධාරී [ ]
දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී) [ ]

(ii) සීමාවාසික පත්වීම ලද දිනය (වෛද්‍ය නිලධාරීන්ට පමණි) :————.

(iii) ප්‍රාථමික ශ්‍රේණියට පත්වීම ලද දිනය :————.

02. ඔබ මෙවර විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයන් ඉදිරියේ ඇති කොටුව තුළ (✓) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය [ ] ආයතන සංග්‍රහය [ ] ගිණුම් [ ]

සිංහල වාචික [ ] දෙමළ වාචික [ ]

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදාල කොටුවේ (✓) හරි ලකුණ යොදන්න.)

සිංහල [ ] ඉංග්‍රීසි [ ] දෙමළ [ ]

04. (අ) දැන් සේවය කරන ආයතනය පැහැදිලිව සඳහන් කරන්න :————.

(ආ) එය අයත් දිස්ත්‍රික්කය :————.

(ඇ) පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමැති විභාග මධ්‍යස්ථානයට අදාල කොටුවේ (✓) හරි ලකුණ යොදන්න. (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර එකී මධ්‍යස්ථානයට අයදුම්කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | | කඳාන | | හම්බන්තොට | | අම්පාර | |
| කළුතර | | ගාල්ල | | බදුල්ල | | වව්නියාව | |
| කුරුණෑගල | | අනුරාධපුර | | රත්නපුර | | | |
| මහනුවර | | මඩකලපුව | | යාපනය | | | |

(ඈ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ රුපියල් 30 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද? :————.

(ඉ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.
(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද ? :————.

(ආ) එසේ පෙනී සිට ඇත්නම් මෙවර වෙනුවෙන් මුද්දර අලවා තිබේද? :————.

[ මුද්දර කොටුව ]

06. අයදුම්කරුගේ සහතිකය :

මගේ දැනුම හා විශ්වාසය පරිදි —

(i) මෙම ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් ප්‍රථම වතාවට නොවන බැවින් රු.... ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියාකිරීමටත් මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මාගේ

විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

07. ආයතන ප්‍රධානියාගේ සහතිකය :

.......................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු වන අතර, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන/නොවන බවටද රු.................. ක් වටිනා මුද්දර මෙම මුද්දර ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවට ද මා ඉදිරිපිටදී අත්සන් කළ බව ද සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

08. විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය :

.......................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු වශයෙන් මගේ කොට්ඨාසයේ/ව්‍යාපාරයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

————,
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත
ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය).

දිනය :————.

(අනවශ්‍ය කොටස් කපා හරින්න)

03-637

---

## නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

### නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයට අයත් සංස්කාරක III ශ්‍රේණියේ සහ ලේඛන සහකාර III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය - 2014

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සංස්කාරක III ශ්‍රේණියේ සහ ලේඛන සහකාර III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙනුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, 28/10, මලලසේකර මාවත, කොළඹ 07 යන ලිපිනයට ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙලවරේ "නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සංස්කාරක III ශ්‍රේණියේ සහ ලේඛණ සහකාර III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2014.04.21 දින වේ.

*සටහන* : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. ඉල්ලුම්පත්‍ර එවීමට ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අපහසුතාවයන් අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

විවෘත තරග විභාගය සමත් වූවන්ගෙන් ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට ලක්කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය නීති කෙටුම්පත් සම්පාදක විසින් තීරණය කරනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම තනතුරට පත්වීම ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 (II) අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළදී ලබාගත යුතු ය. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් වසර 03ක් එනම් පරිවාස කාලය තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය වසර හයක් (06) තුළ ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු ගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v) තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

03. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන අංක 06/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව MN1-2006A රු. 13,120-10X145-11X170-10X240-10X320-රු. 22,040 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

04. *අධ්‍යාපන සුදුසුකම්/පළපුරුද්ද* :

අධ්‍යාපන සුදුසුකම් : අ. පො. ස. (සා. පෙළ.) විභාගයේදී ගණිතය සහ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 04කට අවම වශයෙන් සම්මාන සහිතව එක් වරකදී විෂයයන් 06ක් සමත්ව තිබීම; සහ

අ. පො. ස. (උ.පෙළ.) විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

සටහන :

(i) අයදුම්කරු ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යයට අදාළව අ. පො. ස. (සා. පෙළ.) සහ අ. පො. ස. (උ. පෙළ.) භාෂා විෂයයන් සඳහා සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(ii) අ.පො.ස. (උ.පෙළ.) විභාගයේදී ඉංග්‍රීසි භාෂා විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලැබූ ප්‍රමාණවත් අපේක්ෂකයන් සංඛ්‍යාවක් නොමැතිවූ විට අ. පො. ස. (උ.පෙළ.) විභාගයේදී සිංහල/දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා ඇති අ. පො. ස. (උ.පෙළ.) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සඳහා සාමාර්ථයක් හෝ සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

පළපුරුද්ද : ලේඛණ සහකාර තනතුර සඳහා අයදුම්කරන්නන් පමණක් රජයේ පිළිගත් ආයතනයක පරිගණක කටයුතු පිළිබඳ අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබිය යුතුය. (Open Office - Microsoft Office Word - Excel යනාදිය)

05. වයස් සීමාව : අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

06. කායික සුදුසුකම් :

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,

(ii) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. (තෝරා ගනු ලබන අපේක්ෂකයින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කෙරෙනු ඇත.)

07. වෙනත් සුදුසුකම් :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්පත් කැඳවීමේ නිවේදනය පළ කරන දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

08. 8.1 ලිඛිත විභාගය : සංස්කාරක

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා අක්ෂර වින්‍යාසය පිළිබඳව දැනීම පරීක්ෂා කිරීම | පැය 1 1/2 | 100 | 40 |

8.1.1 විෂයය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා අක්ෂර වින්‍යාසය පිළිබඳව දැනීම පරීක්ෂා කිරීම | සෝදුපත් බැලීමේ නිපුණත්වය ඇගයීම සඳහා විශේෂයෙන් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන වලට සම්බන්ධ සෝදුපත් බැලීමේ කොටස් දෙකකින් හා නිවැරදි සිංහල/ දෙමළ/ඉංග්‍රීසි අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනීම පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්නයක් සමග ප්‍රශ්න තුනකින් යුක්තව සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. |

8.2 ලිඛිත විභාගය : ලේඛණ සහකාර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40 |
| භාෂා හැකියාව | පැය 1 | 100 | 40 |

8.2.1 විෂයය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |
| භාෂා හැකියාව | අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |

සැ. යු.- අපැහැදිලි අත් අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ සඳහා ලකුණු අඩු කරනු ලැබේ. අත් අකුරු කියවිය නොහැකි අපේක්ෂකයෙකුගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැක.;

8.3 සම්මුඛ පරීක්ෂණය :

ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40% කට වඩා ලබා ගත් අයදුම්කරුවන්ගෙන් ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් (පුරප්පාඩු වලට සමාන සංඛ්‍යාවක්) නීති කෙටුම්පත් සම්පාදක විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණක් මගින්, නිවේදනයේ සඳහන් සුදුසුකම් හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

09. විභාග කොන්දේසි :

(i) යම් අයදුම්කරුවෙකු තනතුරු දෙකම සඳහා අයදුම් කරන්නේ නම් අයදුම් පත්‍ර වෙන වෙනම ඉදිරිපත් කල යුතුය.

(ii) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍ය වලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(iii) විභාග ගාස්තුව රු. 1,000 කි.
අයදුම්කරුවන් විසින් ආපසු නොගෙවනු ලබන රු. 1,000 ක විභාග ගාස්තුවක් අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, නමින් ටොරිංටන් චතුරශ්‍රයේ ලංකා බැංකු ශාඛාවේ ඇති හි. අ. 02323278 ට බැරවෙන පරිදි ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවිය හැක. මුදල් ගෙවන ලදුපතෙහි පිටපතක් අයදුම්පත්‍රයට ඇමිණිය යුතුය.

(iv) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

(v) මෙම විභාගය 2014 මැයි මස කොළඹ දී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

(vi) අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන* : ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයෙකුම අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින විට, එහි විභාග ශාලාධිපති වෙත භාර දිය යුතු ය. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(vii) ඉල්ලුම්පත්‍රය, මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුව සෙ. මී. 22 x 29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, 1 සිට 5 තෙක් ශීර්ෂ පළමුවැනි පිටුවට ද 6 සිට 11 තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස සකස් කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ඉල්ලුම් පත්‍රත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(viii) ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලබන අතර, සෑම ආකාරයකින්ම සම්පූර්ණ වූ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

(ix) විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය නීති කෙටුම්පත් සම්පාදක සතුය.

(x) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝණය කළහොත් විභාග නීති රීති යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :*

විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ. :-

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(3) වලංගු රියැදුරු බලපත්‍රය.

*සැළකිය යුතුය :*

(අ) අයදුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.
(ආ) ඉල්ලූ අවස්ථාවක දී අදාල ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

අයදුම්කරුවන් තම ආදර්ශ අත්සන, රජයේ පාසල් ප්‍රධානියෙකු/විශ්‍රාමික ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු හෝ රු. 240,360ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කරවා ගත යුතු ය.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

ජී. එස්. ඒ. ද සිල්වා,
නීති කෙටුම්පත් සම්පාදක.

කොළඹ 12,
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ දී ය.

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයට අයත් සංස්කාරක III ශ්‍රේණියේ සහ ලේඛන සහකාර III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය - 2014

ඉල්ලුම් පත්‍රය

මාධ්‍යය - විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ☐

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(මෙම නිවේදනයේ 9 ii වැනි ඡේදයට අනුව "මාධ්‍යය" පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

1. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(උදා. : SILVA A. B. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

2. 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3. 3.1 උපන් දිනය :

වර්ෂය :————. මාසය :————. දිනය :————.

3.2 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :
අවු. :————. මාස :————. දින :————.

4. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ
පුරුෂ -0, ස්ත්‍රී - 1

5. විවාහක/අවිවාහක බව ඃ
විවාහක 1, අවිවාහක -2

6. අධ්‍යාපන සුදුසුකම් ඃ

(i) අ.පො.ස. (සා. පෙළ)

| වර්ෂය | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|
| | | |

(ii) අ.පො.ස. (උ.පෙළ)

| වර්ෂය | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|
| | | |

7. අදාල වන වෙනත් අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් ඇත්නම් සඳහන් කරන්න :————.

8. වෘත්තීය පළපුරුද්ද :————.

9. මුදල් ගෙවූ කුවිතාන්සි මෙහි අලවන්න.
ලදුපත් අංකය :————.
මුදල් ගෙවූ දිනය :————.
මුදල් ගෙවූ කාර්යාලය :————.

ලදුපත නොගැලවෙනසේ මෙහි අලවන්න

10. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සහතිකය ඃ

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි. තව ද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීතිවලට සහ ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන

දිනය :————.

11. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම ඃ

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ............ (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්............ දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

නිල මුද්‍රාව :————.

03-645

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.